කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය


වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)-2014/15

2020 - අගෝස්තු

**BCOM E 3072 - විගණනය හා සහතික වීම**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහයි : (05) කාලය : පැය 03 යි

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්ණ හතරකට (04) පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

(අ) ඔබ සීමාසහිත වින් (පෞද්ගලික) සමාගමේ, විගණනය භාරව කටයුතු කරන ජ්‍යෙෂ්ඨ විගණකවරයා වේ. සමාගම සතුව කුලියාපිටියේ සහ හලාවත නිෂ්පාදන කම්හල් දෙකක් ඇත. ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇත. දිවයිනේ විවිධ ප්‍රදේශ වල පිහිටි, සමාගමට අයත් ප්‍රදර්ශනාගාර හරහා විකුණුම් සිදු කෙරේ. එක් එක් ප්‍රදර්ශනාගාරය ගනුදෙනුකරුවන්ගෙන් ඇණවුම් බාරගන්නා අතර, ඒවා තොරතුරු තාක්ෂණ පද්ධතියේ ඇතුලත් කරනු ලැබේ. ප්‍රදර්ශනාගාර කාර්යමණ්ඩලයට තොරතුරු තාක්ෂණ පද්ධතියේ වූ තොග සහ ඉන්වොයිස් නිකුත්කිරීමේ අංශ වලට ප්‍රවේශවීමේ අවසරය තිබෙන අතර තොරතුරු තාක්‍ෂණ පද්ධතිය සමාගමේ ගිණුම්කරණ පද්ධතියට සම්බන්ධ කර ඇත. මූල්‍ය දෙපාර්තුමේන්තුව සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තුමේන්තුව ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා ඇත.

සමාගමේ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කෙටුම්පත් කල මූල්‍ය ප්‍රකාශන සහ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ සටහන් සමග පහත දී ඇත.

**ආදායම් ප්‍රකාශන**

| | *(රු. "000")* | *(රු. "000")* |
|---|---|---|
| දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2019** | **2018** |
| විකුණුම් | **1,500** | **1,100** |
| විකුණුම් පිරිවැය | (700) | (600) |
| දළ ලාභය | 800 | 500 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | (45) | (25) |
| පරිපාලන වියදම් | (32) | (22) |
| මෙහෙයුම් ලාභය | 723 | 453 |
| මූල්‍ය වියදම් | (20) | (15) |
| බදු පෙර ලාභය | 703 | 438 |
| බදු වියදම | (70) | (55) |
| වර්ෂය සඳහා ලාභය | **633** | **383** |

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන

| | (රු. "000") | (රු. "000") |
|---|---|---|
| දිනට | 2019 මාර්තු 31 | 2018 මාර්තු 31 |
| <u>ජංගම නොවන වත්කම්:</u> | | |
| දේපල පිරියත හා උපකරණ | 900 | 700 |
| | **900** | **700** |
| ජංගම වත්කම්: | | |
| තොග | 305 | 430 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 90 | 70 |
| මුදල් සහ මුදල් වලට සමාන වන දෑ | 95 | 75 |
| | **490** | **575** |
| මුළු වත්කම් | **1,390** | **1,275** |
| <u>ප්‍රාග්ධනය:</u> | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 500 | 550 |
| රඳවා ගත් ඉපයීම් | 480 | 300 |
| | **980** | **850** |
| <u>ජංගම නොවන වගකීම්:</u> | | |
| බැංකු ණය | 150 | 110 |
| | **150** | **110** |
| <u>ජංගම වගකීම්:</u> | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 260 | 315 |
| | **260** | **315** |
| මුළු ප්‍රාග්ධනය සහ වගකීම් | **1,390** | **1,275** |

ඔබ විසින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතුය.

(i) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව සීමාසහිත වින් (පෞද්ගලික) සමාගම විගණනය කිරීමේදී ඔබ විසින් අවධානය යොමුකිරීමට අවශ්‍ය වන ක්ෂේත්‍රයන් (areas) පහක් (05) දක්වන්න.

(ලකුණු 05)

(ii) සීමාසහිත වින් (පෞද්ගලික) සමාගමේ විගණනයේදී ප්‍රමාණාත්මක සාවද්‍ය අවප්‍රකාශ ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා ඔබට ඉටුකලහැකි අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 10)

(ආ) සීමාසහිත ග්‍රීන් මේඩ් (පෞද්ගලික) සමාගම නිෂ්පාදන සමාගමකි. සමාගමේ කර්මාන්තශාලාවේ වැඩ කරන සේවක සංඛ්‍යාව 250 ඉක්මවයි. එම සේවකයින්ට මාසිකව වැටුප්, අතිකාල ගෙවීම් සහ පැමිණීමේ දීමනා ගෙවනු ලැබේ.

සමාගමේ සේවක පිරිවැටුම (employee turnover) සාපේක්ෂව ඉහලය. මානව සම්පත් අංශය විසින් සමාගමේ වැටුප් ලේඛනය (payroll) පිළියෙළ කරන අතර, මූල්‍ය ගණකාධිකාරී විසින් එය පරීක්ෂා

කරනු ලැබේ. වැටුප් ලේඛනය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කිරීමෙන් අනතුරුව, සෑම සේවකයෙකුගේම ශුද්ධ වැටුප ඔවුන්ගේ අදාළ බැංකු ගිණුම්වලට යවනු ලැබේ.

2018 අප්‍රේල් මාසය සඳහා වැටුප් ගෙවීමෙන් පසුව අලුතින් සේවයට බැඳුණු සේවකයින් පස් දෙනෙකු ඔවුන්ගේ වැටුප් ඔවුන්ගේ බැංකු ගිණුම්වලට යවා නොමැති බවට පැමිණිලි කල අතර තවත් සේවකයින් දහ දෙනෙකු ඔවුන්ගේ අතිකාල දීමනා අඩුවෙන් ගෙවා ඇති බවට පැමිණිලි කර ඇත.
කළමනාකාරිත්වයට දැන් වැඩිපුර වැටුප් ගෙවීම්ද සිදු වී ඇත්දැයි යන්න ගැන අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවයන් පැන නැගී ඇත.

ඔබ විසින්,

(i) වංචාවක් සම්බන්ධයෙන් වූ කල විගණකවරයාගේ වගකීම පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) එහි සේවකයින් අඩුවෙන් හෝ වැඩියෙන් වැටුප් ගෙවීමේ අවදානම තුනී කර ගැනීම සඳහා සීමාසහිත ග්‍රීන් මේඩ් (පෞද්ගලික) සමාගමට ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බැලිය හැකි පාලනයන් තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක - 02

(අ) පරිචයේ යෙදෙන්නාට (Practitioner) සැපයිය හැකි සහතික වීමේ නොවන සේවාවන් තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 03)

(ආ) " උචිත නිර්ණායක මත පදනම්ව, අවස්ථානුකූලව යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමේ අරමුණ සඳහා විගණන පටිපාටි සැලසුම්කිරීම සහ ඉටුකිරීම විගණක විසින් කල යුතුවේ". උචිත නිර්ණායක, විගණන සාක්ෂිවල ප්‍රමාණවත් බව සහ යෝග්‍ය බව යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ඇ) පරිචයේ යෙදෙන්නා (Practitioner) විසින් වෘත්තීය විමර්ශනාත්මකතාවයකින් යුතුව (professional skepticism) සහතිකවීමේ කාර්යභාරය සැලසුම් කිරීම හා ඉටුකිරීම අවශ්‍ය වේ."වෘත්තීය විමර්ශනාත්මකතාවය" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි නිර්වචනය කරමින්, සහතිකවීමේ කාර්යභාරය සැලසුම් කිරීම හා ඉටුකිරීම කෙරෙහි එහි අවශ්‍යතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක - 03

(අ) සහතිකවීමේ කාර්යභාරයක් යනු පාර්ශවයන් තුනක(03)ගේ සම්බන්ධතාවයකි. සහතිකවීමේ කාර්යභාරයකට සම්බන්ධ පාර්ශවයන් තුන (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සෘජුවම බලපාන නීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් විගණකගේ වගකීම පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ඇ) සීමාසහිත පාලිත සමාගමේ විගණනය අවසානයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී විගණන සමාගම විසින් ඉදිරිපත් කර ඇති විගණන වාර්තාව 100% ක් නිවැරදි වන අතර සාවද්‍ය වාර්තාවක් ලැබීමේ කිසිදු අවදානමක් නැතැයි සීමාසහිත පාලිත සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු පවසයි. මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වේද? සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක - 04

(අ) විගණකවරයෙකුට අදාළ වන ප්‍රධාන ආචාර මූලධර්ම කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(ආ) සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් (Reasonable Assurance Engagement) සම්බන්ධයෙන් පරිචයේ යෙදෙන්නෙකු විසින් ඉදිරිපත් කරන නිගමනය හා සැසඳීමේදී සීමිත සහතිකවීමේ කාර්යභාරයක් (Limited Assurance Engagement) සම්බන්ධයෙන් ඔහු ඉදිරිපත් කරන නිගමනය වෙනස් වන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ඇ) ඔබ සීමාසහිත “මෙගා” සමාගමේ විගණනය කරගෙන යයි. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය තුලදී මෙගා සමාගමේ කළමනාකාරිත්වයේ සැලකිය යුතු වෙනසක් සිදු විය. නව කළමනාකාරිත්වය විසින් ගිවිසුම් කොන්දේසි පිලිබඳව වැරදි වැටහීමක් ඇතිකරගෙන ඇති බැව් ඔබට හැඟී ඇති බැවින් අලුතින් ගිවිස ගැනීමේ ලිපියක් නිකුත් කිරීමේ අවශ්‍යතාවය ගැන ඔබ නව කළමනාකාරිත්වයට දැනුම් දෙන ලදී. එහිදී ඔබ විසින් මූලිකවම ඇතුලත් කරනු ලබන කරුණු මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක - 05

පහත සඳහන් පද කෙටියෙන් විස්තර කරන්න.

(අ). කාර්යසාධන ප්‍රමාණාත්මකතාවය (Performance Materiality)
(ආ). ආවේනික අවදානම (Inherent Risk)
(ඇ). විෂය කරුණ (Subject Matter)
(ඉ). පුනරාවර්තන විගණනය (Recurring Audit)
(ඊ). වෘත්තීය විනිශ්චය (Professional Judgement)

(එකකට ලකුණු 05 බැගින් = මුළු ලකුණු 25)